Rathnayake, R.M.R.B.
PAPER

**නාගරික අඩු පහසුකම් ජනාවාසයන් හි ආර්ථික කටයුතු හා ඒ ආශ්‍රිත චර්යාරටාවන් පිළිබඳ අධ්‍යයනයක් (කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරිනි)**

ආර්. එම්. ආර්. බී. රත්නායක, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

R.M.R.B. Rathnayake, Department of Geography, University of Kelaniya

වර්තමාන නාගරීකරණ ක්‍රියාවලිය හමුවේ සීඝ්‍රයෙන් වර්ධනය වන්නා වූ අඩු පහසුකම් සහිත ජනාවාස ලංකාව තුළද සුවිශේෂ ලක්ෂණයකි. මෙලෙස වර්ධනය වෙමින් පවතින නාගරික අවිධිමත් අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් ද පුළුල් පරාසයක් පුරා විහිදී යයි. කොළඹ නගරයේ ද විසිරිණු අවිධිමත් අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් සමූහයක් දක්නට ලැබෙන අතර අඩු පහසුකම් සහිත ජනාවාසයන්හි පුද්ගලයින් විවිධ මට්ටමින් මෙයට දායක වේ. ඒ අනුව විවිධ ගැටලු රාශියක් මෙම ප්‍රදේශයේ ව්‍යාප්තව ඇත.

මෙම පර්යේෂණයට ලුණු පොකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කුටුම්බයන් 50 ක අහඹු නියැදියක් පර්යේෂණය සඳහා යොදා ගෙන ඇත. මෙහි අඩු පහසුකම් ජනාවාසයන් මෙන්ම එහි පදිංචි පුද්ගලයන්ගේ අවිධිමත් ආර්ථික ක්‍රියාකාරකම් පදනම් කරගෙන නාගරික පරිපාලනයට, නාගරික ආර්ථිකයට, නාගරික සමාජයට මෙන්ම නාගරික පරිසරයට බලපෑමක් සිදුවනවා ද යන්න විමසීමට බඳුන් කළ යුතුය. ඒ අනුව ඔවුන් ආර්ථිකයට දක්වන දායකත්වය යහපත්වේද, අයහපත්වේද යන්න පිළිබඳව විමසා බැලිය හැකි අතර එම ආර්ථික කටයුතු පදනම් කරගනිමින් ගොඩනගාගෙන ඇති චර්යාවන්හි සුවිශේෂ ලක්ෂණ මොනවාද, යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි අරමුණ විය. විශේෂයෙන්ම මෙම අධ්‍යයනය තුළින් නාගරික අඩු පහසුකම් ජනාවාස වල ව්‍යාප්තිය හා එහි රටාවන් හඳුනාගත යුතුය. එමෙන්ම අඩු ආදායම්ලාභී ජනාවාස පුනස්ථාපන ක්‍රියාමාර්ග තුළින් සිදුවන නාගරික සංවර්ධනය හමුවේ, එම ප්‍රජාවට සිදුවන ආර්ථික, සාමාජික හා පාරිසරික බලපෑම පිළිබඳව සරලව අදහස් විමසීමද මෙහි අවශ්‍යතාවකි. ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර මගින් දත්ත රැස්කළ අතර දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය සඳහා සංඛ්‍යානමය හා සංඛ්‍යානමය නොවන ක්‍රම භාවිතා කර ඇත.

අධ්‍යයනය තුළින් එළඹුනු නිගමනය වන්නේ නාගරික අඩු පහසුකම් ජනාවාසයන්හි පදිංචි පුද්ගලයන්ගේ අවිධිමත් ආර්ථික කටයුතු නගරයේ සියලුම ක්‍රියාවලියන් තීරණය කරන බවයි. නාගරික පරිපාලනයට, නාගරික ආර්ථිකයට, නාගරික සමාජයට මෙන්ම නාගරික පරිසරයටද අවිධිමත් ආර්ථික ක්‍රියාකාරකම් හා රැකියා කටයුතු සෘජුව බලපාන බව නිගමනය කළ හැකිය. එමෙන්ම ඔවුන්ගේ ආර්ථිකය පදනම් කරගෙන සමාජ, පාරිසරික කටයුතු මෙන්ම චර්යා රටාවන් ද තීරණය කරන බව හඳුනාගත හැකි විය. අධ්‍යාපන තත්ත්වය මෙන්ම වයස් සීමාව මත රැකියාව තීරණය වන බව මින් සාක්ෂාත් කර ගත හැකි විය. උගතුන්ගේ රැකියා හිඟය පිළිබඳ වූ ජාතික ප්‍රශ්නය, කොළඹ නගරය තුළ අනෙකුත් ප්‍රදේශවල තරම් උග්‍ර නොවන බවද දක්නට වේ. විශේෂයෙන් රැකියාව හා අනෙකුත් ආර්ථික කටයුතු වලදී පුරුෂයන්ගේ දායකත්වය ඉහළ මට්ටමින් පැවතිණි. අඩු ආදායම් ලබන ජනයා සේවාවන් පදනම් කරගත් රැකියා කටයුතුවල නිරතවන බව දක්නට විය. එමෙන්ම ඔවුන්ගේ ආර්ථිකය පදනම් කරගෙන සමාජ, පාරිසරික කටයුතු මෙන්ම චර්යා රටාවන් ද තීරණය කරන බව හඳුනාගත හැකිය. මෙය නගරයේ අනෙකුත් ආර්ථික කටයුතු රඳා පවතින අංශයක් ලෙසට විශ්ලේෂණයේදී අවබෝධ විය. මෙම පුද්ගලයන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් නගරයෙන් ඇත් වුවහොත් එය නාගරික ආර්ථික ක්‍රියාකාරකම් බිඳ වැටීමට හේතු වන බව තවදුරටත් පැහැදිලි වේ.

මූලිකපද: නාගරීකරණය, අඩු පහසුකම් ජනාවාස, ආර්ථික කටයුතු